(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 86.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 සැප්තැම්බර් 26 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

677/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ඉන්දියාවේ අදානි සමාගම සමඟ බලාගාර ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබූ බව දන්නේද;

(ii) වර්තමාන රජය විසින් එම ව්‍යාපෘතිය සංශෝධනය කරන්නේද;

(iii) නොඑසේ නම්, අවලංගු කරන්නේද;

(iv) පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ජාත්‍යන්තර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

737/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කොළඹ වරායේ බහාලුම් නිදහස් කර ගැනීමේ අර්බුදකාරී තත්ත්වයක් මතුවී තිබෙන බවත්;

(ii) එම තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමුද්‍රීය සැපයුම් සමාගම් සහ වාණිජ මණ්ඩල විසින් ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සැලැස්මේ ඇති යෝජනා කවරේද;

(ii) එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

810/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'E-Motoring' ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනය තෝරා ගැනීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ විවිධ දූෂණ සිදුවී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

834/2025

ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මක දර්ශකය අනුව මහනුවර නගරය ඉතා අවදානම් මට්ටමක පවතින බව දන්නේද;

(ii) ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

880/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.01.01 සිට 2025.03.31 දක්වා මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(ii) පැවති රජයේ විශේෂ වැඩසටහනක් යටතේ ඉහත කාලය තුළ එම පුද්ගලයන්ට 'උරුමය' සින්නක්කර ඔප්පු ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iv) 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා ගැනීම සඳහා අයදුම් කරන ලද ඉහත පුද්ගලයන් අතරින් සමහර පුද්ගලයන්ට එම ඔප්පු ලබාදී නොමැති බව දන්නේද;

(v) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) ඔවුන්ට මේ දක්වා 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

980/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) අනුරාධපුර, ගල්නෑව, හෝගොඩයාගම බීජ ගොවිපළට අයිති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ගොවිපළ යම් පුද්ගලයෙක්/ආයතනයක් වෙත බදු පදනම මත ලබාදී තිබේද;

(v) එසේ නම්, බදු පදනම මත ලබා දුන් වර්ෂය කවරේද;

(vi) බදු පදනම මත ලබා ගත් පුද්ගලයාගේ/ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(vii) එම පුද්ගලයා/ආයතනය නිසි පරිදි බදු මුදල් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1008/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය වේදිකා හරහා වැරදි තොරතුරු සහ වෛරී කතා, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වාර්ගික කලබල හෝ කෝලාහල ඇති කරන අන්තර්ගතයන් බෙදා හැරීම නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) එවැනි හානිකර අන්තර්ගතයන් බෙදා හැරීම වැළැක්වීම සඳහා සමාජ මාධ්‍ය සමාගම්, විදුලි සංදේශ සේවා සපයන්නන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධවී කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එලෙස ගෙන ඇති පියවරවල ස්වභාවය කවරේද;

(iv) එම පියවර ක්‍රියාත්මක කිරීම මඟින් අත්කර ගෙන ඇති ප්‍රගතිය කවරේද;

(v) මාර්ගගතව වෛරී කතා පැතිරවීම, වාර්ගික උසිගැන්වීම් සිදු කිරීම හෝ කලහකාරී ක්‍රියා සංවිධානය කිරීම අධීක්ෂණය කිරීම සඳහාම වෙන්වූ අධීක්ෂණ ඒකකයක් හෝ අන්තර්-ආයතන කාර්ය සාධක බලකායක් ස්ථාපනය කර තිබේද;

(vi) වෛරී කතා සම්බන්ධයෙන් වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මකව ඇති යාන්ත්‍රණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1210/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොතුවිල්, අරුගම්බේ ප්‍රදේශයේ මුස්ලිම්වරුන්ගේ මෆාසා මුස්ලිම් දේවස්ථානයට ආසන්නව ඊශ්‍රායලයට අයත් නීති විරෝධී 'සබාත් නිවස' නමැති ආයතනයක් ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය කොපමණ කාලයක සිට ක්‍රියාත්මක වන්නේද;

(iii) එම ආයතනය පිහිටුවා ඇති ඉඩම ලබාදී ඇති පදනම කවරේද;

(iv) එම ආයතනයට දැඩි ආරක්ෂාවක් ලබා දීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ආකර්ෂණීය ප්‍රදේශයක් වන අරුගම්බේ ප්‍රදේශයේ ජනතාව, දේශීය හා විදේශීය සංචාරකයන්, ධීවරයන් සහ ගොවි ජනතාව බියට පත්වී සිටින බව දන්නේද;

(v) ඉහත ආයතනය ඉවත් කිරීම සඳහා කිසියම් පියවරක් ගෙන තිබේද;

(vi) එම ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ පොතුවිල් ප්‍රාදේශීය සභාවෙන් වාර්තාවක් කැඳවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1270/2025

ගරු සුජීව දිසානායක මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග වර්ග තුන කවරේද;

(ii) ප්‍රධාන අපනයන භෝගයක් ලෙස පොල් භෝගය නම් කරන ලද වර්ෂය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති පොල් ගස් සංඛ්‍යාව සහ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න වැඩි කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොල් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත කවරේද;

(ii) පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(iii) පොල් ලෙලි ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන දේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව හා විදේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒවායේ ප්‍රධාන අපනයන නිෂ්පාදන සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පොල් ලෙලි කර්මාන්තය ආශ්‍රිතව ඇති ප්‍රධාන ගැටලු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1295/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිළිඳු දරුවන්ගේ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සමාජ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 'රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල', 2000 අංක 28 දරන (සංස්ථාගත කිරීමේ) පනත අනුව පිහිටුවා ඇති බවත්;

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ, පන්සිල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පර්චස් 100ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් 2003.04.07 දින එයට පරිත්‍යාග කරන ලද බවත්;

(iii) 2005 වර්ෂයේදී ඉහත ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකර වෘත්තීය පුහුණු ආයතනයක් ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේදී එම ආයතනය වසා දමන ලද බවත්;

(iv) 2023 වර්ෂයේදී එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර, එම ඉඩම වටා කම්බි ගසා, ගේට්ටුවක් සවිකර, එම ඉඩමේ පොල්පැල සිටුවා එය පුද්ගලික භුක්තියට නතු කර ගැනීමට කූඨ ලෙස හා වංචනික ලෙස කටයුතු කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත ඉඩම පොදු ජනතාවගේ පොදු කටයුතු සඳහා රජයේ සුදුසු ආයතනයක් වෙත පැවරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විසර්ජන,— 2026 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුල්‍යා ප්‍රතිපාදන සැකසීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා. 85/2025

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) පළමුවැනි ඡේදයට ඉක්බිතිවම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට :—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

2.

පා. 92/2025

ගරු අරවින්ද සෙනරත් මහතා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

*3.

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*7.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**[1]**

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.